**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී - 2023/ 2024**

---------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ("සමාගම ") සහ සමාගමේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි  හේතුවෙන් මූල්‍ය  ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි  සැලැසුම්  කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන්  සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ජලේඛන සැකසීමෙන්ව්‍යා , චේතනාන්විත මඟහැරීමෙන්වරදවා , දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවයගිණුම්කර ,ණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ලදී ප්‍ර . ප්මාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍යරකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතරඑම හෙළිදරව්කිරීම් , අනාගත සිද්ධීන් හෝ ,කෙසේ වුවද .මාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුයප්‍ර තත්ත්වයන් මතසමාගමේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය .

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා ආයතනවල මූල්‍ය තොරතුරු හෝ සමූහය තුල ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගන්නා ලදී.සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ  කාර්ය සාධනය සඳහා මා වගකිව යුතු වේ. මාගේ විගණන මතය සඳහා සම්පූර්ණයෙන් මා වගකිව යුතු ය.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ,සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල,කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව සහකර්තව්‍ය ,

- සම්පත් සකසුරුවම් ලෙසකාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට , සම්පාදනය කර භාවිතා කර ඇති බවඅනුකූලව ප්‍ර.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1. ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පහසුකම් 1708කට අදාළව වසර 5කට වැඩි දිගු කාලීන අයවිය යුතු ශේෂයන් රු. මිලියන 3,860ක් අයකර ගැනීමට සමාගම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, පහසුකම් 81කට අදාළව වසර 10ට වැඩි දිගුකාලීන අයවිය යුතු ශේෂ රු. මිලියන 86ක්ද ඉහත ශේෂයට ඇතුළත් විය. | 2024 මැයි 16 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (38/2024) සහ 2024 මැයි 21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (CP 59/2024) නිර්දේශ අනුව, යෝජිත පහසුකම් 1,206ක රු.2,695,311,129 ක් (ශුද්ධ ලැබිය යුතු මුදල) කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට 2024 මැයි 28 වන දිනැති අංක BP 179/2024 දරණ යෝජනාව ඉදිරිපත් කරන ලදී.<br>කෙසේ වෙතත්, එම යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ අතර, අවම වශයෙන් මැතිවරණය අවසන් වන තෙක් කපා හැරීම් කල් දැමිය යුතු බව ඔවුන්ගේ අදහස විය. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2024/25 මූල්‍ය වර්ෂය තුලදී නැවත ඉදිරිපත් කරන්නෙමු. | මෙම දිගුකාලීන අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

## 1.6 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තෝරාගත් නියැදියට අනුව, ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් InBank සහ Microfin පද්ධතිවල කාලානුරූපව අක්‍රීය කර නොමැත. ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රීය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි නොගැනීම හේතුවෙන් ව්‍යාපාර ගනුදෙනු සඳහා වගකීම් පැවරීමේදී | ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රීය කිරීම සම්බන්ධ ගැටලුව අපි පිළිගනිමු. වැළැක්වීමේ පියවරවල කොටසක් ලෙස, අපි පහත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත:<br><br>ක්ෂණික ප්‍රවේශ ඉවත් කිරීම: හිටපු | ඉල්ලා අස් වූ/මාරු කරන ලද සේවකයින්ගේ පරිශීලක ගිණුම් නියමිත වේලාවට අක්‍රිය කිරීම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

සැලකිය යුතු ගැටළු ඇති විය හැකිය. උදාහරණයක් ලෙස, ඉල්ලා අස් වූ සේවකයෙකුගේ ගිණුම භාවිතා කර දැනට සිටින පරිශීලකයෙකුට පද්ධතිය තුළ වංචනික ගනුදෙනු සිදු කළ හැකි නමුත් ඔහු/ඇය වෙනත් කෙනෙකුගේ පරිශීලක ගිණුමක් භාවිතා කරන බැවින් එවැනි ගනුදෙනු සඳහා ඔහුට/ඇයට වගකීමක් පැවරිය නොහැක.

සේවකයින් InBank සහ Microfin වැනි තීරණාත්මක පද්ධති වෙත ප්‍රවේශය රඳවා නොගන්නා බව සහතික කිරීම සඳහා ඉල්ලා අස් වූ සේවකයින්ගේ සියලුම පද්ධති ප්‍රවේශය ඉල්ලා අස්වීම ක්‍රියාවට නැංවූ වහාම අක්‍රීය කරනු ලැබේ.

සාමාන්‍ය (Routine) විගණන: බලයලත් පුද්ගලයන්ට පමණක් සක්‍රීය ගිණුම් ඇති බව තහවුරු කර ගැනීමට සහ කිසියම් විෂමතාවයක් කඩිනමින් විසඳන බවට සහතික කිරීමට පද්ධති ප්‍රවේශය පිළිබඳ නිරන්තර විගණන පවත්වනු ලැබේ.

අනවසර පිවිසුම් අවදානම අවම කිරීම සහ විය හැකි වංචනික ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා මෙම පියවර ක්‍රියාත්මක වේ. පද්ධති ආරක්ෂා කිරීම සඳහා අපගේ ක්‍රියාවලීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු පෙර ලාභය රු. මිලියන 5,376 ක් වූ අතර ඊට අනුරූප පෙර වසරේ අනුරූප ලාභය රු. මිලියන 4,342 කි. ඒ් අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,034 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, පොලී ආදායම් සහ පොලී වියදම් පිළිවෙලින් රු. මිලියන 1,343 ක් සහ රු. මිලියන 1,006 කින් අඩු වී ඇති අතර අනෙකුත් මෙහෙයුම් වියදම් රු. මිලියන 694 කින් වැඩි වී ඇත. මෙම වර්ධනය සඳහා හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 1,724 කින් ප්‍රතිවර්තනය සහ පොලී වියදම් රු. මිලියන 1,006 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2023/2024 | 2022/2023 | 2021/2022 | 2020/2021 | 2019/2020 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු.මිලියන) | 28,853 | 30,197 | 23,881 | 24,983 | 31,459 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | (4.45) | 26.45 | (4.41) | (20.58) | 2.02 |
| පොලී වියදම් (රු(මිලියන . | 17,201 | 18,207 | 10,832 | 13,064 | 15,787 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (%) (අඩුවීම) | (5.53) | 68.08 | (17.09) | (17.24) | 0.90 |
| බදු පෙර ලාභය (මිලියන .රු) | 5,376 | 4,342 | 6,650 | 5,873 | 4,552 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (%) (අඩුවීම) | (23.82) | (34.71) | 13.23 | 29.02 | (30.87) |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳාවැඩිවීමේ , හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම අඩු ) / (වීම (රු.000) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | (1,343,282) | (4.45) | විශේෂයෙන් මූල්‍ය වර්ෂය මුල් භාගයේ දී දිගු කාලීන කල්පිරීමක් සහිත ණය ලබාදීම සීමා කිරීමේ උපායමාර්ගික තීරණයක ප්‍රතිඵලයක් ලෙස ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පොලී ආදායම අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර, ආයෝජන කළඹෙහි පොලී අනුපාත අඩුවීමේ බලපෑමද හේතුවිය. |
| පොලී වියදම | (1,006,058) | (5.53) | පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ප්‍රතිපත්ති පොලී අනුපාතවල අඩුවීම පිළිබිඹු කරමින්, ණය සුරැකුම්පත් සහ බැංකු ණය ගැනීම් සඳහා වන පොලී වියදමේ කැපී පෙනෙන අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| ගාස්තු සහ කොමිස් ආදායම | 279,533 | 22.09 | මූල්‍ය වර්ෂයේ දෙවන භාගයේ සිට දිගු කාලීන කල්පිරීමක් සහිත ණය දීමට සමාගම ගත් තීරණයට අනුකූලව ගාස්තු සහ කොමිස් ආදායම ඉහළ යනලදී. |
| හානිකරණ වියදම් | (1,724,261) | (303.31) | සමාගම විසින් අයකර ගැනීම් පිළිබඳ උපායමාර්ගික අවධානය යොමු කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර වර්ෂය සඳහා සමුච්චිත එකතු කිරීමේ අනුපාතය සියයට 100.34ක් ළඟා කර ගැනීමෙන් පීපල්ස් ලීසිං සමාගමට ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් හානිකරණ වියදම් වල ප්‍රතිවර්තනයක් වාර්තා කිරීමට හැකි විය. මීට අමතරව, ආර්ථික සාධක ගැලපුමෙන් හිතකර බලපෑමක් ඇති විය. |
| සේවක වියදම් | (240,434) | (5.36) | වෙළඳපොල පොලී අනුපාත අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස කාර්ය මණ්ඩල සහනදායි ණය ප්‍රදානය කිරීමේදී කාර්ය මණ්ඩල ප්‍රතිලාභය සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් පුද්ගල පිරිවැය සියයට 5.36 කින් අඩු විය. මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 (SLFRS 9) ට අනුකූල වීම සඳහා මෙම ගැලපීම සිදු කර ඇත. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ සමහර වැදගත් අනුපාත ශ්‍රී , .කාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේලංකා මහබැංකුව විසින් ප්‍ර

| **විස්තරය** | **ආංශික අනුපාතය (2023 දෙසැම්බර් 31 දිනට)** | **සමාගම** | |
|---|---|---|---|
| | | **2023/2024** | **2022/2023** |
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය )ROE) | 12.09 | 8.68 | 7.68 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 4.23 | 3.25 | 2.47 |
| පොලී ආන්තිකය | 7.74 | 7.69 | 7.35 |
| **වත්කම් ගුණත්ව අනුපාතය** | | | |
| අක්‍රීය අනුපාතය | 17.76 | 15.24 | 14.26 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර (%10 අවම) ග්ධනයප්‍රා 1 | 21.13 | 30.00 | 25.76 |
| මුළු ප්‍රාග්ධනය (%14 අවම) | 22.33 | 29.70 | 26.61 |